රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 133

මගේ අංකය: 2/9/361(එච්)v
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7. 79.02.08

සියලුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානයන් වෙත.

## පරීක්ෂණ නිලධරයන් පත්කිරීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්, යම් රජයේ නිලධරයකු වෙත බලය පවරා දෙනු ලැබුවේද, ඒ රජයේ නිලධරයා විසින් කරන ලද මාරු කිරීමේ හෝ සේවයෙන් පහකිරීමේ නියමයකින් හැකහොත් විනය කටයුත්තක් සම්බන්ධව කරන ලද වෙනත් යම් නියමයකින් අතෘප්ත කවර හෝ රජයේ නිලධරයකුට, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචන කිරීමට අයිතියක් ඇතැයි දක්වන, 1978 ඔක්තෝබර් මස 18 දාතමින් යුතු අංක. 130 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2:12 වැනි ඡේදය කෙරේ අවධානය යොමුකළ මැනවි.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව අභියාචන මණ්ඩලයකි. ඒ අනුව, කලින් රාජ්‍ය සේවා විනය මණ්ඩලය විසින් කළ කාර්යයක් වූ පරීක්ෂණ විනිශ්චය සභා පත්කිරීම සම්බන්ධයෙන් එය කටයුතු නොකරයි.

03. එහෙයින් සෑම අමාත්‍යාංශයක්ම තම අමාත්‍යාංශයේ සහ ඒ යටතේ වන දෙපාර්තමේන්තුවල සේවයේ නියුතු අය අතරින් තෝරා ගත් පරීක්ෂණ නිලධර මඬුල්ලක් වෙනම තබාගත යුතුය. නිලධරයකු මේ මඬුල්ලට තෝරා ගැනීමට පෙර ඔහුගේ පෞද්ගලික ලිපිගොනුව පරීක්ෂා කර ඔහු විනය කාර්ය පරිපාටියේ නීතිරීති යටතේ කිසිම දඬුවමක් ලබා නැතිබව නිසැකව දැනගත යුතුය. මඬුල්ලට තෝරා ගනු ලැබූ නිලධරයාගේ අවංක භාවය පිළිබඳව ප්‍රශ්නයක් නොතිබිය යුතුය. අවශ්‍යතාව ඇතිවන අවස්ථාවලදී එකී මඬුල්ල යාවත්කාල කළයුතුය.

04. මෙලෙස තබාගන්නා මඬුල්ලෙන් පරීක්ෂණ විනිශ්චය සභාවක් පත්කිරීමට අමාත්‍යාංශයකට නුපුළුවන් වන අවස්ථාවකදී, කලින් රාජ්‍ය සේවා විනය මණ්ඩලය විසින් පවත්වා ගෙන ගියාවූත්, දැනට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඇත්තාවූත් විශ්‍රාමික/සේවය නොකරන පරීක්ෂණ නිලධර මඬුල්ලේ නම් ලැයිස්තුවක් ලබාගත යුතුය.

05. මෙම ලැයිස්තුවට විශ්‍රාම ලත් අයගේ නම් එකතු කිරීමට ඒ ඒ අමාත්‍යාංශයට පුළුවන. එය කළයුත්තේ එබඳු නිලධරයන් අවසන් වරට සේවයේ නියුතුව සිටි අමාත්‍යාංශයේ ලේකම් වරයාගෙන් මෙම නිලධරයන් පරීක්ෂණ නිලධරයන් ලෙස පත්කිරීමේ යෝග්‍යතාව ගැන වාර්තාවක් ලබාගැනීමෙන් පසුවය.

06. අංක 83 හා 1974 අප්‍රේල් 29 වැනි දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අවලංගු කළ සේ සලකනු මැනවි.

Sirivardhana

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්